# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 144/18 — 1975 ජනවාරි 03 වැනි සිකුරාද — 1975.01.03**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 21/61 13-

**1961 අංක 62 දරණ වෙළඳුන්ට බලපත්‍ර දීමේ පනත**

1961 අංක 62 දරණ වෙළෙඳුන්ට බලපත්‍ර දීමේ පනතේ 3 වන සහ 4 වන වගන්ති වලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍ය.

1974 දෙසැම්බර් මස 30 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 1974 වෙළෙඳුන්ට බලපත්‍ර දීමේ (අංක 2) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පැට්‍රල් සැපයුම් ස්ථානයක් භාරව සිටින සෑම පුද්ගලයෙකුම විසින් ස්වකීය බිම් මීටරයේ නිරවද්‍යතාව පරීක්ෂාකර බැලීමේ කාර්යය සඳහා පඩි සහ මිම් ආඥාපනත යටතේ මුද්‍රා තබන ලද ඉම්පීරියල් ගැලුමේ භාජනයක් එම පැට්‍රල් සැපයුම් ස්ථානයේ තබාගත යුතුය.

3. ගැලුම් ගණනින් පැට්‍රල් මිලදී ගන්නා කිසියම් ගැණුම්කරුවකු විසින් ඔහු මිලදී ගන්නා පැට්‍රල් ඔහුගේ වාහනයේ පැට්‍රල් ටැංකියට වැක්කිරීමට පෙර ඉහත සඳහන් කළ මුද්‍රා තබන ලද ඉම්පීරියල් ගැලුමේ භාජනයට පොම්ප කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

4. 3 වන නියෝගයේ කාර්යයන් සඳහා බිම් මීටරයේ දක්වෙන පැට්‍රල් ගැලුමක් ඉහත සඳහන් මුද්‍රා තබන ලද ඉම්පීරියල් ගැලුමේ භාජනයට පොම්ප කළ විට එම භාජනයේ පැට්‍රල්වල මට්ටම ඉම්පීරියල් ගැලුමක් දක්වන සලකුණට අඩුවෙන් තිබේ නම් එම මට්ටම ඉම්පීරියල් ගැලුමක් දක්වන සලකුණ තෙක් ගෙන එම පිණිස අවශ්‍ය වන පැට්‍රල් ප්‍රමාණය එම පැට්‍රල් සැපයුම් ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් ඊට එකතු කළ යුතුය.

5. මේ රෙගුලාසි වල—

"බිම් මීටරය" යන්නෙන් ගබඩා ටැංකියක සිට භාජනයකට යම් ද්‍රව ප්‍රමාණයක් යවන විට ඒ ද්‍රව ප්‍රමාණය මැනීමේ උපකරණයක් අදහස් වේ;

"පැට්‍රල්" යන්නෙන් පැට්‍රෝලියම් මෝටර් ස්ප්‍රීතුව අදහස් වන අතර ඩීසල් තෙල් ද ඊට ඇතුළත් වේ.

1-409/1

1 A——ඒ 11767—5,160 (75/01)

එල්. ඩී.—බී. 89/50 (II)

9

## මිල පාලන පනත

(173 වන අධිකාරය වූ) මිල පාලන පනතේ 6 වන වගන්තිය යටතේ විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍ය.

1974 දෙසැම්බර් මස 30 වන දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 1974 මිල නියම පල කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පාලක විසින් පනතේ 4 (4) (ආ) වන වගන්තිය යටතේ යම්කිසි නියමයක් ගැසට් පත්‍රයෙහි කරනු ලැබීමට අමතරව ඒ නියමයෙහි සංක්ෂිප්තයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවෙන් පළ කෙරෙන එක් දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක ඔහු විසින් පලකරනු ලැබිය හැකිය.

3. මේ නියෝග වල—

"පනත" යන්නෙන් (173 වන අධිකාරය වූ) මිල පාලන පනත අදහස් වේ;

"පාලක" යන්නට පනතෙහි ඇති අර්ථයම ඇත.

1-409/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී